# ප්‍රේමකීර්ති ආයෙත් මරන්න එපා

ජෝර්ජ් රොබින්සන් ද සිල්වා

පසුගිය ජූනි 31 වැනිදාට ප්‍රවීණ මාධ්‍යවේදී සහ ගී පද රචක ප්‍රේමකීර්ති ද අල්විස් අපෙන් වියෝ වී වසර 22 ක් විය. ඒ නිමිත්තෙන් මෙරට ජාතික පුවත්පත් දෙකක සහ සන්නස පුවත්පතේ එක්තරා අද්භූත ලිපියක් පළ විය. අප එසේ පවසන්නේ එක්තරා ලියුම්කරුවකු විසින් මෙරට ලියනු ලැබ පළ වූ එම එකම ලිපිය ජාතික මට්ටමේ පුවත්පත් දෙකකම පළවීම නිසාත් එම ලිපියේ "ප්‍රේමකීර්ති නොලියූ ගී" (වෙනත් ගී පද රචකයින් විසින් රචිත ගී) අඩ සියයකට වැඩි ගණනක් ප්‍රේමකීර්ති විසින් රචිත ගී ලෙස සඳහන් කර තිබීම නිසාත් ය.

එම ලියුම්කරුගේ අද්භූත ලිපියේ සඳහන් වූ පරිදි ප්‍රේමකීර්ති යනු ගී පද රචකයෙකු වූ ලෝකයේ ප්‍රථම සිඟිති දරුවා ය. එලෙස වී ඇත්තේ මෙසේ ය. ලියුම්කරු පවසන අයුරු "ඉසුරුමුනියෙහි පැතලි ගලෙක" නම් ගීතය ද ප්‍රේමකීර්තිගේ පද රචනයකි. අප දන්නා අයුරු මෙම ගීතය නිර්මාණය වී ඇත්තේ 1949 වසරේදී වන අතර ප්‍රේමකීර්ති ඉපදී ඇත්තේ 1947 වසරේදීය. එවිට ප්‍රේමකීර්ති මේ ගීතය පද රචනය කළේ නම් ඔහු වයස අවුරුදු දෙකකටත් වඩා අඩු සඟිත්තෙකු නොවේ ද ?



එම අද්භූත ලිපියේ පියසේන කොස්තා විසින් රචිත "ඉසුරුමුනියෙහි" ගීතය මෙන්ම "දකුණු ලකේ අගනගරේ" සහ "දඹුලු ගලේ " ගීත ද ප්‍රේමකීර්ති විසින් රචිත බැව් සඳහන් විය. අප දන්නා අයුරු එම ලිපියේ ප්‍රේමකීර්ති විසින් රචිත ගීත යැයි සඳහන් වූ වෙනත් ගී පද රචකයින් විසින් රචිත ගී අඩ සියයකට වැඩි වේ.

"පරණ කෝට්" ගීතය "ලොකුම හිනාව" චිත්‍රපටයේ ඇතුළත් වූ මහාචාර්ය සුනිල් ආරියරත්න විසින් රචිත ගීතයක් වන අතර "පවුරු වළල්ලක් බැඳලා" සහ "හිත හීලෑ නැහැ" ගීත පද රචනා ද සුනිල්ගේමය. 'උඩරට කඳුකර සිරියා පරදන' ගීතයේ පද රචනය ආටිගල සරච්චන්ද්‍රගේය.

"අඹ දඹ නාරං" නිතීඥ ජෝන් ද සිල්වාගේ පද රචනයකි. අරිසෙන් අහුබුදු විසින් "ගිලෙම් ඔබේ ගුණ මුහුදේ" පද රචනය කර ඇති අතර "මහ මුහුදු විමානේ" "එගොඩහ යන්නො" "නිවහල් සිතුවිලි සිතනා" ගී පද රචනා කළේ ඩෝල්ටන් අල්විස් ය. ජනප්‍රිය චිත්‍රපට නළුවෙකුව ද සිටි හර්බට් ඇම්. සෙනෙවිරත්න පද රචනය කළ "පිදුරු සෙවි කළ පැල්පතේ " ගීතය මෙන්ම 1955 දී තිරගත වූ "මතභේදය" චිත්‍රපටයේ රුක්මණී දේවී ගැයූ ඒ. ජේ. ද සොයිසා පද රචනය කළ "පෙම් මල් මාලා" ගීතය ද ප්‍රේමකීර්තිගේ යයි එම අද්භූත ලිපියේ සඳහන් වී තිබුණි. එහෙත් ඒ වන විට ප්‍රේමකීර්ති අට හැවිරිදි දරුවකුව සිටියේ ය.

1959 දී තිරගත වූ "දෛවයෝගය" චිත්‍රපටයේ ඇතුළත් වූ මොහිදීන් බෙග් ගැයූ "ආදරියේ රුචිරාණනියේ " ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ කළ පද රචනයකි. ඒ වන විට ප්‍රේමකීර්ති දොළොස් හැවිරිදි දරුවෙක් වූවේය.

"ආදරයක හැඟුමන් " ගීතයේ පද රචනය කළේ උපාලි අත්තනායක විසිනි. "ඇළ දොළ ගංගා" ගීතයේ පද රචකයා කේ. එන්. කැමිලස් පෙරේරා ය. ශ්‍රී නිහාල් ඒ. ජයසිංහ රචිත "සෙවණේ කුඹුක් සෙවණේ " (චිත්‍රපටය " මොණරතැන්න) ගීයත්, ගී පද සහ තැටි නිෂ්පාදකවරයකු ද වන ස්වර්ණදාස හේරත් පද රචනය කළ "අමරාදේවී" ගීතයත්, ගජමන් පුවතේ "තුට කළ ලෙවන් " ගීතයත් එම අද්භූත ලිපියේ සඳහන් වූ පරිදි ප්‍රේමකීර්ති විසින් රචිත ගීත වීම විහිළුවකි. එසේම ශබ්ද පරිපාලකවරයකුව සිටි ඩොනල්ඩ් අයිවන් පද රචනය කළ "මගේ ළමැද සුව යහනක්" ගීතය ද එම ලියුම්කරුට අනුව ප්‍රේමකීර්ති ගේ පද රචනයක් වීමත් විහිළුවකි.

"කප් සුවහස් කල් පෙරුම් පුරා ගෙන" ගී පද රචනය ජයතිස්ස අලහකෝන්ගේය. "ප්‍රේම කතාවක චරිත දෙකක් " පද රචනය කළේ තු. ව. කුසුම්පාල විසින් ය. "ගී ලියන්න මට කීවේ" ගාමිණී ලේල්වල පද රචනය කළ ගීතයකි. 'රූංපෙත්ත කැරකෙනවා' ගීතය රචනා කළේ උදය චාමර වීරසිංහ ය.

ජනප්‍රිය නිවේදකයෙකුව සිටි කරුණාරත්න අබේසේකර විසින් රචිත "කියන්න සුළඟේ ඔබ", "සුදු පාට මීදුම් ගලාලා" (චිත්‍රපටය " එදත් සූරයා අදත් සූරයා) "ඔබේ නිල් නුවන් " " "මා නෙත් කැදැල්ලේ ", "එන්න මද නලේ ", සයුර වෙත යන ගඟ" සහ "රැල්ලේ කිරි වැල්ලේ " (චිත්‍රපටය " දෙයියන්ගේ රටේ) ගීත ද සිහි විකල් වූවකු සේ ප්‍රේමකීර්ති විසින් පද රචනය කළ බැව් සඳහන් කර තිබූ එම ලියුම්කරුගේ ලිපිය හේතුවෙන් දැනටමත් බරපතළ වැරදි කිහිපයක්ම සිදු වී ඇති බවත් ඒ නිසා මෙය සුළුකොට සැලකිය හැකි කරුණක නොවන බවත් කිව යුතුය.

එවැනි එක වරදක් පිළිබඳ කරුණාරත්න අබේසේකරගේ පුත් දිලීප අබේසේකර අප සමඟ එළිදරව් කළේ මෙසේ ය. " ප්‍රේමකීර්ති ද අල්විස් වෙනුවෙන් ගුණානුස්මරණ වැඩ සටහනක් කළ එක්තරා ගුවන් විදුලි නාලිකාවක් එහිදී ඉදිරිපත් කළේ එම ලිපියේ සඳහන් වූ වැරදි තොරතුරුයි. එය අසා උන්නු මට කුමක් කරන්න ද කියා සිතාගන්න නොහැකි වුණා. ඉතිහාසය වළලන්නේ මේ වගකීමකින් තොර මාධ්‍ය ආයතනයි. ගෙවී ගිය වසර විස්සක් තිස්සේම ඔවුන් සිය වගකීම් පැහැර හැරීම් නිසා අද මෙවැනි බරපතළ වැරදි සිදුවෙනවා."

ගායන ශිල්පියකු මෙන්ම කණ්ඩායම් සංගීතයේ පුරෝගාමී සංගීතවේදියකුව ද සිටි ක්ලැරන්ස් විජේවර්ධන රසබර ගීත රාශියක් පද රචනා කළ ගී පද රචකයකු ද වන අතර " උඩරට නිළිය හැඩ වගේ " ගීතය ද ඔහුගේ පද රචනයකි. එය ඔහු මුලින්ම "සුපර් ගෝල්ඩන් චයිම්ස්" කණ්ඩායම සඳහා නිර්මාණය කළ වග අපගේ මතකයයි.

1984 වසරේදී හොඳම ගායන ශිල්පියා ලෙස මිල්ටන් මල්ලවආරච්චි සරසවි සම්මානයෙන් පිදුනම් ලැබූ " කැන්දන් යන්නම් රන් මල් මාලා දාලා" (චිත්‍රපටය " ඈතින් ඈතට) ගීතයේ පද රචකයා ජනප්‍රිය සිනමාවේදියකු ද වන සෝමපාල ලීලානන්ද ය.

"මඟ තොටදී හමුවෙද්දී" යනුවෙන් මිල්යන් මල්ලවආරච්චි ගීත දෙකක් ගායනා කළ බවත් ඉන් එක් ගීතයක් කේ. ඩී. කේ. ධර්මවර්ධන රචනා කළ බවත් "මඟ තොටදී හමුවෙද්දී අපට කතා හැදුණා" යනුවෙන් ගැයෙන ගීතයේ පද රචනය කළේ ප්‍රේමකීර්ති බවත් ප්‍රවීණ ගුවන් විදුලි නිවේදිකා සමදරා කොට්ටෙගේ අප සමඟ පැවසුවාය. එය වැදගත් හෙළිදරව්වක් වෙන්නේ මෙම ගීත ප්‍රචාරයේදී මින් ඉදියට ගී පද රචකයින් ගේ නම් වරදවා යොදා ගැනීමෙන් වැළකීමට හැකියාව ලැබෙන හෙයිනි.

ජනප්‍රිය කවියකු වන සුනිල් ගුණවර්ධනයන්ගේ විවාහය හිතුවක්කාර විවාහයකි. ඒ අත්දැකීම ඇසුරෙන් ඔහු විසින්ම ගීතයක් ලියුවේ ය. එම ගීතය වූවේ "හිතුවක්කාරෙට කරගත්තයි කියලා" ගීතයයි.

ප්‍රේමකීර්ති පද රචනය කළ උපහාස ගී රාශියක් ප්‍රෙඩී සිල්වා ගායනා කළේය. එහෙත් ප්‍රෙඩී සමඟ කලාවතී ගායනා කළ "තේ කූඩය" ගීතයේ පද රචනය කළේ හේමසිරි හල්පිට ය.

ගුණදාස කපුගේ ගැයූ "සබඳ අපි කඳු නොවෙමු" දර්ශන මේදිස් රචිත ගීතයක් වන අතර "උතුරු කොනේ නුඹ හිනැහේ " ගීතය චන්ද්‍රා වාකිෂ්ට රචිත ගීතයක් වේ.

ඒ සැමට වඩා විහිළුවක් සහ පුදුමයක් ද වන්නේ අපේ පත්තර මිතුරන් වන ධර්මසිරි ගමගේ දෙල්තොට චන්ද්‍රපාල, සිරිල් ඒ සීලවිමල, අජන්තා රණසිංහ, සමන් චන්ද්‍රනාත් වීරසිංහ, උපාලි බණ්ඩාර වීරසේකර සහ දයා ඩී. ෆොන්සේකා ආදීන් පද රචනය කළ ගීත පිළිබඳ වත් යන්තම් හෝ දැනුමක් එම අද්භූත ලිපිය පළ කළ අපේ සහෝදර පුවත්පත් දෙකෙහිම කර්තෘවරුන්ට නොතිබීමය. එලෙස තිබුණා නම් මෙවැනි බරපතළ වරදක් නොවන්නේමය.

ප්‍රේමකීර්ති නොලියූ අපේ පත්තර මිතුරන් ලියූ සමහර ගීත මෙසේ ය. "මගේ නාමලී" (චිත්‍රපටය " ගොපල හඬ) සහ "නිවන් පුරට" ගීත ධර්මසිරි ගමගේ විසින් රචිත ගීත දෙකකි. "සුන්දර රුවන් හද මන්දිරේ" (චිත්‍රපටය " කේසර සිංහයෝ) සිරිල් ඒ. සීලවිමල විසින් පදරචනය කළ ගීතයකි. " රත්තී අරන් උදැනැක්කේ" ගීතය පද රචනය දෙල්තොට චන්ද්‍රපාලගේය. "හිරු පායනවා මල් පිබිදෙනවා" ටී. බී. පෙරමුණේ තිලක විසින් රචිත ගීතයකි. "කවිකාරියේ සින්දු කියනා" ගීතයේ පද රචනය සමන් චන්ද්‍රනාත් වීරසිංහගේ වන අතර අජන්තා රණසිංහ විසින් රචිත ගී අටකි.

"බොඳ මීදුම්" (චිත්‍රපටය " දුහුළු මලක්) " කොහෝ කොහෝ කොහේ ඉඳන්", "කිරි කවඩි සිනා", "සැළලිහිණියෝ", "කල්පනා ලොව", " පුංචි දවස්වල", "දරුවෝ ඇති අම්මාලා" සහ "ආගන්තුක කුරුල්ලා" එම ගී පද රචනා අටයි. දයා ඩී. ෆොන්සේකා විසින් රචිත "දෑස රිදෙනවා" ගීතය මෙන්ම උපාලි බණ්ඩාර වීරසේකර විසින් සකුන්ත ජයවර්ධන නමින් රචිත "මේ කඳුළු තොටුපළයි" ගීතය ද එම ලියුම්කරු ඔහුගේ අද්භූත ලිපියේ දී ප්‍රේමකීර්තිගේ පද රචනයක් යයි අසත්‍ය පවසා ඇත.

■

